**කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය - 2018**

**---------------------------------------------------**

1. **මූල්‍ය ප්‍රකාශන**

**-----------------**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

**------------------------------**

කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ("අධිකාරිය") 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය/ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**---------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**

**-----------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

1.4 **විගණන විෂය පථය**

**------------------------**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රමිති 03 අනුව අධිකාරිය විසින් සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද නමුත් පරිහරණය කරනු ලබන රු. 28,532,499 ක් වූ වාහන හා කාර්යාල උපකරණ ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කර නොතිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අංක 03 අනුව සම්පූර්ණයෙන් ක්ෂය වූ වත්කම් 2018 වර්ෂයේ තක්සේරු දෙපාර්තුමේන්තුව මගින් ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කරන ලදී'ගිණුම් ප්‍රමිතියට අනුකූලව 2019 අවසන් ගිණුම් තුල ප්‍රත්‍යාගණන ගැළපීම සිදු කරන බව දන්වමි | ප්‍රත්‍යාගණන වාර්තා ලබාගෙන ප්‍රමිතිය අනුව ගිණුම්ගත කලයුතුය. |

## 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ රු.6,649,194 ක්වූ පොලි ආදායම මත ගෙවියයුතු රු.1,861,775 ක් වූ බදු මුදල ගිණුම්ගත කර නොතිබුණු අතර එම වටිනාකමින් ලාභය වැඩියෙන් දක්වා තිබුණි . | සමාලෝචිත වර්ෂයේ පොලී ආදායම ලෙස මූල්‍ය ප්‍රකාශණ තුල දක්වා ඇත්තේ බැංකුව විසින් අධිකාරිය වෙත ලැබිය යුතු පොලිය ලෙස ලිඛිතව දැනුම් දුන් මුදලය එම බැංකුව සදහන් කළ පොලී මුදලින් මෙම විමසීමට අනුව බැංකුවෙන් මේ පිළිබද විමසා ගිණුම් ගත කළ පොලිය නිවැරදි පොලිය නොවන්නේ නම් 2019 වර්ෂයේ අවශ්‍ය ගැලපීම් කිරීමට කටයුතු කරන බව දන්වමි බදු මුදල් අඩු කිරීමෙන් පසුව අගය යන පදනමින් ගිණුම් ගත කළ බව දන්වමි | පොලී ආදායම මත බදු මුදල් ගණනය කර දේශිය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවීම් කලයුතුය. |

## 1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- | --- |
| | රු. | | | |
| විවිධ තොග | 8,600,639 | සත්‍යාපන වාර්තා | රු.8,600,639 ක් වූ විවිධ තොග ශේෂය මෙම වසරේ ආරම්භක ශේෂය වන අතර එම ශේෂය සදහා වන තොග අයිතම අනුව විශ්ලේෂණාත්මක වාර්තා මේ සමග ඉදිරිපත් කරමි තව දුරටත් පවතින හදුනා නොගත් ශේෂයන් නිවැරදිව සැසදුම් කර ඉදිරිපත් කිරීමට සටහන් කර ගතිමි. | වර්ෂය අවසානයේ පවතින තොග සඳහා තොග සත්‍යාපන වාර්තා ඉදිරිපත් කිරීම කලයුතුය. |

1.6 **නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2014 නොවැම්බර් 12 දිනැති අංක 25/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි 7 වන වගන්තිය | අධිකාරිය විසින් පිහිටුවා තිබුණ ක්‍රීඩා හා සංස්කෘතික ඒකකයට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව කළමනාකරණ සහකරුවන් 09 දෙනෙකු බඳවාගෙන දෛනික වැටුප් පදනම මත පත්වීම් ලබා දී තිබුණි. | 2018 වසර සඳහා වැව්ලි සවිය ක්‍රීඩා උත්සවය න සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා යෙදවීමට ආයතනයේ සේවකයන් නොමැති වූ බැවින් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහිතව පළපුරුදු සේවකයින් ඒ සඳහා තාවකාලික පදනමින් බඳවා ගනු ලැබූ අතර අදාල වැඩසටහන අවසන් වූ විට ඔවුන් සේවයද අවසන් වීමට නියමිත වේ | චක්‍රලේඛයෙහි විධිවිධාන අනුව අනුමැතිය ලබා ගතයුතුය. |
| (අ) 1987අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනතේ(1)(අ) උපවගන්තිය | කොන්ත්‍රාත් ගිවිසුමේ පිරිවැය රු.පනස් ලක්ෂයක් ඉක්මවන අවස්ථාවක සෑම ටෙන්ඩර්කරුවකුම පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර්වරයා වෙත ලියාපදිංචි කළ යුතු වුවද, එවැනි ලියාපදිංචි නොවූ ටෙන්ඩර් කරුවෙකුට රු.9,218,635 ක්වූ කොන්ත්‍රාත්තුවක් පිරිනමා තිබුණි. | අදාල කොන්ත්‍රාත් කාර්යය සම්බන්ධව කොන්ත්‍රාත්කරු හා මෙම අධිකාරියේ ගිවිසුම්ගත වීමට අදාල කොන්දෙසි ඉදි කිරම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (ICTAD/SBD/01-2/Edition January 2007) කොන්දේසි හා එහි සිදු කර ඇති සංශෝධන මත ටෙන්ඩර් කරුවන්ට මිල ගණක් ඉදිරිපත් කිරීමට ඉඩ ලබා දී ඇති බැවින් ඊට අනුගතව ටෙන්ඩර්කරුවන් විසින් මිල ගණන් ඉදිරිපත් කර ඇත. | පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර්වරයා වෙත ලියාපදිංචි ටෙන්ඩර් කරුවන්ගෙන් ටෙන්ඩර් කැඳවීමට කටයුතු කලයුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු 62,748,445 ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 129,533,198 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.66,784,753 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ සංවර්ධන කටයුතු සඳහා ලද ප්‍රදාන වැඩිවීම හා ඊට අදාල වියදම් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය කාර්යාල හතරක සමාලෝචිත වර්ෂය අවසන් වනවිට රු.71,856,901 ක් වටිනා ගොඩනැගිලි ඉදිකර තිබුණද එම ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය අධිකාරියට පවරා ගෙන නොතිබුණි . | ආයතනය සතු ඉඩම් 49 ක් පවතින අතර ඉන් ඉඩම් 5 ක් සඳහා පමණක් නීත්‍යානුකූල අයිතිය අධිකාරිය සතුව ඇති අතර මේ සම්බන්ධ පූර්ණ විශ්ලේෂණයක් කර ඉතිරි ඉඩම් 46 හා ගොඩනැගිලි අධිකාරියට නෛතිකව පවරා ගානීම සඳහා අදාල ආයතන හා රේඛීය අමාත්‍යාංශය සමග සෘජුව සාකච්ඡා පවත්වා කටයුතු සිදු කෙරෙමින් පවතින බව දන්වමි | නීත්‍යානුකූල අයිතිය අධිකාරියට පවරා ගෙන නොමැති ඉඩම්වල අයිතිය පවරා ගැනීම. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අදියර පහකින් යුතුව තේ නැවත වගා සහනාධාර ලෙස 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා ගෙවන ලද මුදලින් පළමු අදියර 3 සඳහා පමණක් රු.920,127,271 ක් ලබාගෙන තිබූ හෙක්ටයාර් 577 ක් හිමි ගොවීන් ඉතිරි සහනාධාර ලබාගෙන තේ වගා කිරීමට කටයුතු නොකිරීමෙන් එම සහනාධාර ලබා දීම මඟින් අපේක්ෂා කල අරමුණු ඉටුකර ගැනීමට නොහැකි වී තිබූ අතර ඒ සම්බන්ධයෙන් කළමනාකරණය අවධානය යොමුකර නොතිබුණි. | පුනරුත්ථාපනය කරන ලද බිම් වෙනත් වගාවන් සඳහා යොදාගෙන ඇති ගොවීන්ගෙන් මෙතෙක් ඔවුන්ට ගෙවා ඇති සහනාධාර මුදල් ආපසු අයකර ගැනීමේ ක්‍රම වේදයක් දැනට සකස්කරමින් පවතින අතරණි මෙම අවසර පත්‍ර නිකුත් කරන ලද ක්ෂේත්‍ර නිලධාරීන් මෙම පැල සිටුවීමේ කාර්යයන් අවසන් කරවා ගැනීමට වගවනු ඇත. | සහනාධාර මුදල් ලබාගෙන තේ නැවත වගා කටයුතු නොකරනලද ගොවීන් වගා කටයුතු සම්පූර්ණකිරීමට දිරිගැන්වීම හා පද්ධතියේ දුර්වලතා හඳුනාගෙන පද්ධතිය වැඩිදියුණුකිරීම. |
| (ආ)ව්‍යාප්ති හා උපදෙස් පුහුණු වැඩසටහන් වෙනුවෙන් ඉකුත් වර්ෂයේ වැය කරන ලද මුදල රු.16,561,557ක් වුවද සමාලෝචිත වර්ෂයේ එය රු.32,360,151 ක් දක්වා වැඩිවී තිබුණද සහභාගී වු ගොවීන් සංඛ්‍යාව 12,363 කින් අඩු වී තිබුණි. | ව්‍යාප්ති වියදම් වර්ෂයට 2017 වර්ෂයේදී ඉහළ 2018 සාපේක්ෂව අගයක් ගෙන ඇත්තේපෙර වර්ෂවලදී ගොවි පුහුණු වැඩසටහන් සඳහා වෙන්කල ප්‍රතිපාදන ඌන භාවිතය හේතුවෙනි 2018 . වර්ෂයේදී ගොවි පුහුණු වැඩසටහන් සඳහා වෙන්කල මුදල් නිසිලෙස භාවිතා කිරීම සම්බන්ධයෙන් දැඩි | රජයේ මුදල් ආර්ථිකමය, කාර්යක්ෂමව හා ඵලදායීව අදාල අරමුණ සඳහා යොදාගැනීමට කටයුතු කලයුතුය. |

අධීක්ෂණයක් පවත්වා ගැනීමත් ඊට අමතරව ගොවින් දැනුවත් කිරීමට මාධ්‍ය හා ප්‍රචාරණ කටයුතු මගින් වැඩි ප්‍රතිඵල ලබාගත හැකි හෙයින් ඒ සඳහා අයවැය මගින් වැඩිපුර ප්‍රතිපාදන වෙන්කර එම කටයුතු සඳහා වියදම් දැරීම මගින් වඩාත් ඵලදායී ලෙස ගොවීන් දැනුවත් කිරීමට කටයුතු කිරීමත් හේතුවෙන් බව සඳහන් කරමි.

## 3.3 අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ පොහොර සහනාධාර ගෙවීම සඳහා ලද මුදලින් රු.13,466,664 ක් අපේක්ෂිත කාර්යය සඳහා නොයොදවා රඳවා තබා ගෙන තිබුණි. | පොහොර සහනාධාරය සඳහා 2016,2017,2018 වසර වලදී රු.මි.1700ක් අප වෙත ලබා දී ඇති අතර එම මුදල් සියල්ලම විධිමත් ක්‍රමවේද වලට අනුකූලව හිමිකම් ලද ගොවීන් 347,106 දෙනෙකු අතර නිවැරදිව බෙදා දී ඇත ඇතැම් අවස්ථා වලදී මෙම ගොවීන්ගේ ගිණුම් අක්‍රිය වීමණි ගිණුම් අංක වල අඩු පාඩු දෝෂ සහිතව භාර දීම හා අයිතිකරුවන් එම ගිණුම් හිමි ස්ථාන වල නොමැති වීම වැනි හේතු මත බැංකු ගත කරන ලද මුදල් ඔවුන්ගේ ගිණුම් වලට බැර නොවීය. මේ හේතුවෙන් ඉතිරිව තිබූ එම මුදල් ප්‍රමාණය මෙහි දක්වා ඇත. | සහනාධාර මුදල් අපේක්ෂිත කාලය තුලදී සහනාධාරහිමි ගොවීන් වෙත ලබාදීමට කටයුතු කිරීම හා භාවිතා නොකරන ලද මුදල් නැවත භාණ්ඩාගාරයට යැවීමට කටයුතු කලයුතුය. |
| (ආ) ගංවතුර සහනාධාර දිරිදීමනා සඳහා ලද රු.46,991,226 ක් සමාලෝචිත වර්ෂය අවසානය වනවිටත් අපේක්ෂිත කාර්යය සඳහා නොයොදවා ගිණුම්වල රඳවා ගෙන තිබුණි. | ඉතිරි වූ රු. මිලියන 145.9 න් රු. මිලියන 100 ක් නැවත අමාත්‍යාංශයට යොමු කරන ලදී. පසුව ඉතිරි වූ රු. මිලියන 45.99 ද හිමිකම් නොපැම මත සහනාධාර ප්‍රතික්ෂේප වීම මත බැංකුවෙන් ලද රු. මිලියන 1.09 යන ප්‍රමාණයද ඇතුළත්ව සම්පූර්ණ ශේෂය ලෙෂ රු. 46,991.226 ක මුදල තවදුරටත් ගිණුම් තුළ අන්තර්ගත ඇති බව දන්වමි. | භාන්ඩාගාරයෙන් ලද මුදල් අපේක්ෂිත කාර්යය සඳහා යෙදවීමෙන් පසු ඉතිරි මුදල් නැවත භාන්ඩාගාරයට ප්‍රේෂණය කලයුතුය. |

## 3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පිරිවැය රු.1,575,000 ක් වූ කැබ්රථය 2016 පෙබරවාරි 23 දින පෞද්ගලික ගරාජයක් වෙත අලුත්වැඩියාවන් සඳහා ලබා දී තිබූ අතර එම කැබ් රථය අලුත්වැඩියාවන් සිදු කර මේ දක්වා ආපසු භාර දී නොතිබුණි. | 52-2605 වාහනය විධිමත් ප්‍රසම්පාදන ක්‍රම හරහා අලුත්වැඩියාව සදහා නාවලපිටිය ඔටෝ කෙයා ආයතනය වෙත භාර දුන් අතර ඔවුන්ගේ ඇස්තමේන්තුගත මුදල රු 585,000 කි. මෙම රථයේ අලුත්වැඩියාව ආරම්භයට ප්‍රථම ගරාජ්කරු විසින් තව දුරටත් මෙහි කිරීමට ඇති අලුත්වැඩියාවන් පිළිබදව අප වෙත දැනුම් දෙන ලදී. මේ පිළිබද තාක්ෂණික ඉංජිනේරු උපදෙස් ලබා ගත් අතර ඔවුන්ගේ උපදෙස් වූයේ මෙම රථය අලුත්වැඩියා කර ධාවනයේ යෙදවීම පිරිවැය ඵලදායී නොවන බවයි. | වාහන පාලනය සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරීන් ආර්ථිකමය , කාර්යක්ෂම හා ඵලදායි අයුරින් වාහන අළුත්වැඩියාකිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කල.යුතුය. |

## 3.5 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ස්වභාවිකව ඇතිවන අස්වැන්න හානිවීම වෙනුවෙන් රජයට නිරන්තර සහනාධාර ලබාදීමට සිදුවීමේ ගැටළුවට පිළියමක් වශයෙන් ස්වාභිමානි රක්ෂණ ක්‍රමය ප්‍රචලිත කිරීම සඳහා රු.1,000,563 ක් වැයකර පුවත්පත් දැන්වීම් පලකලද සමාලෝචිත වර්ෂය අවසාන වනවිට මෙම වැඩසටහන අත්හිටුවා තිබුණි. එම නිසා වැයකරනලද මුදල නිෂ්කාර්යය වියදමක් බවට පත්වී තිබුණි. | කුඩා තේ වතු හිමියන් නිරන්තරව මුහුණ දෙන කාලගුණික හා දේශගුණික විපර්යාස වලින් ඇති වන වගා හා මූල්‍ය හානි වෙනුවෙන් රජය විසින් විශාල මුදලක් වැය කිරීමට සිදු වන නිසා මෙම ගොවීන් රක්ෂණ ක්‍රමවේදයකට ඇතුළත් කිරීම සදහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ඇතිව ක්‍රියා කළ අතර මූලික කටයුතු ඉතා නිවැරදිව ස්ථානගත කළ නමුදු එහි අපේක්ෂිත ඉලක්ක කරා ලගා වීමට නොහැකි වූ නිසා ව්‍යාපෘතිය අත් හැර දැමීමට සිදු වූ බව දැනුම් දෙමි | ව්‍යාපෘති සඳහා වියදම් දැරීමට පෙර එය ඉටුකිරීමට ඇති හැකියාව පිළිබඳව ශක්‍යතා අධ්‍යනයක් කිරීමට හා ඉලක්ක කරා ළඟාවිය හැකිපරිදි සැලසුම් පිළියලකොට ක්‍රියාත්මක කිරීම කලයුතුය. |